## ආර්ථික හා සමාජ පිරිවැය

### බලශක්තිය

1984 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ වර්ධනයක් ඇතිවිය. මෙම වර්ධනයට හේතු වූයේ ඛණිජ තෙල් නිෂ්පාදනවල ජාත්‍යන්තර මිල අඩුවීම මෙන්ම යහපත් කාලගුණික තත්ත්වය නිසා දේශීය ජල විදුලි බල උත්පාදනය වැඩි වීමත්ය. ඛණිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානයේ විනිශ්චිත නිල මිළ ගණන්වලට වඩා අඩු මිළක් පැවති එතැන් වෙළෙඳපොලෙන්, දේශීය ඛණිජ තෙල් අවශ්‍යතාවයන්ගෙන් සියයට 60 කටත් වඩා වැඩි ප්‍රමාණයක් මිළදී ගැනීම නිසා, ශ්‍රී ලංකාවට ලෝක වෙළෙඳපොලෙහි තෙල් මිළ පහළ යාමේ වාසිය ලබා ගැනීමට හැකි විය. වර්ෂය තුළදී ජල විදුලි බලය නිපදවන ජලාශ පිහිටි දියත් ප්‍රදේශවල පැවති සතුටුදායක කාලගුණික තත්ත්වය නිසා ජල විදුලි බලාගාර වැඩි ධාරිතාවයකින් ප්‍රයෝජනයට ගත හැකි වූ අතර, තාප බල උත්පාදනය අඩු කිරීමට හැකි විය. මේ අතරතුර, වර්ෂයේ අවසාන කාර්තුවේදී, කඩිනම් මහවැලි වැඩ පිළිවෙල යටතේ ඉදි කෙරෙන වික්ටෝරියා ජල විදුලි බල ව්‍යාපෘතියේ ප්‍රථම අදියර දෙක සහ සපුගස්කන්දේ ඩීසල් බලාගාරය ආරම්භ කරන ලදුව, එහි ධාරිතාවය ජාතික බලශක්ති පද්ධතියට එකතු කරන ලදී. එමනිසා බලශක්ති අංශයේ වැදගත් ලක්ෂණය වූයේ වියදම් අධික තාප බලය වෙනුවට අඩු වියදම් සහිත ජල විදුලි බලය ආදේශ කිරීමය.

1983 වර්ෂයේදී මුළු ආනයන වටිනාකමින් සියයට 24 ක් වූ ඛණිජ තෙල් ආනයන, 1984 වර්ෂයේදී සියයට 23 දක්වා පහත වැටුණි. ඛණිජ තෙල් ආනයන වටිනාකම, ඛණිජ තෙල් නොවන අපනයන වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස දක්වන කල 1982 වර්ෂයේදී පෙර නොවූ අන්දමින් සියයට 67 දක්වා වැඩි වී 1983 වර්ෂයේ දී සියයට 49 දක්වාත්, 1984 වර්ෂයේ දී සියයට 32 දක්වාත් පහත වැටුණි. ශුද්ධ ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයන, ඛණිජ නිෂ්පාදිත නොවන මුළු අපනයනවල අනුපාතයක් ලෙස ගණනය කළ කල්හි අපනයන ඉපයීම් කෙරෙහි ඛණිජ තෙල් ආනයනවල බලපෑම, 1983 වර්ෂයේ දී වූ සියයට 37 ක ප්‍රමාණය 1984 වර්ෂයේ දී සියයට 22 දක්වා අඩු විය.

ශ්‍රී ලංකාවේ වාණිජ බලශක්ති අංශයේ ප්‍රධානතම මූලය ඛණිජ තෙල් වන අතර, එය 1984 වර්ෂයේ දී වාණිජ සහ වාණිජ නොවන බලශක්ති මුළු ඉල්ලුමෙන් සියයට 25 ක් පමණ විය. 1984 වර්ෂයේ දී ඛණිජ තෙල් පිරිපහදු යන්ත්‍රාගාරය නොකඩවා ක්‍රියාත්මක වීම නිසා ලංකා ඛණිජ තෙල් නිතිගත සංස්ථාවට ඛණිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීමට හැකි වූ අතර, 1983 වර්ෂය හා සංසන්දනය කිරීමේදී 1984 වර්ෂයේදී සියයට 16 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් බොර තෙල් ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 17 ලක්ෂ 33 දහස දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 1984 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් එක් ලක්ෂ 29 දහසක් වූ ආනයනය කරන ලද. පිරිපහදු නිෂ්පාදන ප්‍රමාණය 1983 වර්ෂයට වඩා සියයට 74 කින් අඩු විය.

පසුගිය වසර දෙකෙහිම පහත වැටෙමින් තිබූ ඛණිජ තෙල් අපනයන ඉපැයීම් මේ වසරේදී, සියයට 23 ක (විගැහි සියයට 18) වැඩි වීමක් දක්වමින් රුපියල් 328 කෝටි 80 ලක්ෂයක් (විගැහි 12 කෝටි 60 ලක්ෂයක්) විය. ලංකා විදුලි බල මණ්ඩලය විසින් පරිභෝජනය කළ ඛණිජ තෙල් ප්‍රමාණය අඩු වීම වැනි, අපනයනය කළ හැකි සමහර ඛණිජ තෙල් නිෂ්පාදනවල දේශීය පරිභෝජනය අඩුවීම නිසා වර්ෂය තුළදී තෙල් නිෂ්පාදන වැඩි ප්‍රමාණයක් අපනයනය කළ හැකි විය.

පසුගිය වර්ෂයේ ඇතිවූ මිළ වැඩි කිරීමේ බලපෑම පෙන්නුම් කරමින් 1984 වර්ෂයේදී දේශීය ඛණිජ තෙල් පරිභෝජනයේ නව නැම්මක් ඇති විය. 1983 වර්ෂය තුළ දී භූමිතෙල් මිළ එහි නිෂ්පාදන පිරිවැයට වඩාත් ආසන්න කිරීම හේතුකොට ගෙන 1984 වර්ෂයේ දී භූමිතෙල්

පරිභෝජනය සියයට 7 කින් පහත වැටුණි. 1984 වර්ෂයේ දී පෙට්‍රල් පරිභෝජනය වැඩි වූයේ මඳ වශයෙනි. 1983 වර්ෂයේ ඇතිවූ මිල වැඩිවීමේ බලපෑම පෙන්නුම් කරමින් දැව්තෙල් පරිභෝජනය සියයට 7 කින් පහත වැටීම විශේෂ ලක්ෂණයක් විය. තවද විදුලිය බල උත්පාදනයේදී තෙල් පරිභෝජනය ශීඝ්‍ර ලෙස අඩුවීම හේතුවෙන් සියලුම අංශ විසින් පරිභෝජනය කළ බැර ඩීසල් හා දැව් තෙල් ප්‍රමාණයන්හි සැළකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, ගමනාගමන අංශයේ පුළුල් වීමත් සමග සුදු ඩීසල්වල දේශීය පරිභෝජනය සියයට 5 කින් වැඩි විය.

## 1 . 21 සංඛ්‍යා සටහන

### බලශක්ති අංශයේ මූලික ලක්ෂණ 1983 – 1984

| ශීර්ෂය | ඒකක | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස | 1984 | 1983 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඛනිජ තෙල් නිෂ්පාදන .. | | | | | |
| 1·1 අපනයන .. | රුපියල් දශ ලක්ෂ | 2,681·9 | – 16·7 | 3,287·8 | 22·6 |
| 1·2 ආනයන .. | රුපියල් දශ ලක්ෂ | 11,023·7 | – 9·8 | 10,681·1 | – 3·1 |
| 1·3 ආනයනය කළ ප්‍රමාණය .. | මෙට්‍රික් ටොන් | | | | |
| 1·3·1 බොර තෙල් .. | | 1,491,973 | – 23·1 | 1,733,257 | 16·2 |
| 1·3·2 පිරිපහදු නිෂ්පාදන .. | | 487,593 | 80·4 | 129,443 | – 73·5 |
| 1·4 බොර තෙල් සාමාන්‍ය මිළ .. | බැරලයක් රුපියල් | 714 | – 0·1 | 751 | 5·2 |
| 1·5 දේශීය මිළ .. | ලීටරයක් රුපියල් | | | | |
| 1·5·1 පෙට්‍රල් .. | | 13·50 | 35·0 | 13·50 | — |
| 1·5·2 භූමිතෙල් .. | | 6·58 | 69·1 | 6·58 | — |
| 1·5·3 සුදු ඩීසල් .. | | 8·13 | 36·9 | 8·13 | — |
| 1·5·4 බැර ඩීසල් .. | | 7·83 | 37·8 | 7·83 | — |
| 1·5·5 සුපිරි ඩීසල් .. | | 9·28 | 40·6 | 9·28 | — |
| 1·5·6 දැව් තෙල් – 500 .. | | 4·89 | 10·1 | 5·22 | 6·8 |
| 800 .. | | 4·84 | 10·0 | 4·87 | 0·6 |
| 1,000 .. | | 4·72 | 10·0 | 4·72 | — |
| 1·5·7 තාර .. | | 6·95 | 10·8 | 6·95 | — |
| 1·6 දේශීය අලෙවිය .. | මෙට්‍රික් ටොන් | | | | |
| 1·6·1 පෙට්‍රල් .. | | 117,491 | 2·9 | 119,237* | 1·9 |
| 1·6·2 භූමිතෙල් .. | | 162,032 | – 6·9 | 150,247* | – 7·3 |
| 1·6·3 සුදු ඩීසල් .. | | 463,992 | 1·3 | 486,663* | 4·9 |
| 1·6·4 බැර ඩීසල් .. | | 295,203 | 106·3 | 84,874* | – 71·2 |
| 1·6·5 සුපිරි ඩීසල් .. | | 10,418 | 24·6 | 14,345* | 37·7 |
| 1·6·6 දැව් තෙල් .. | | 279,138 | 2·0 | 223,462* | – 19·9 |
| 2. විදුලිය බලය .. | | | | | |
| 2·1 ස්ථාපිත ධාරිතාවය .. | මෙගවොට් | 592·25 | 5·3 | 812·25 | 37·1 |
| 2·1·1 ජල බලය .. | | 402·25 | 8·1 | 542·25 | 34·8 |
| 2·1·2 තාප බලය .. | | 190·00 | — | 270·00 | 42·1 |
| 2·2 ජනනය කළ ඒකක .. | කි.වො.පැ. දශ ලක්ෂ | 2,114·4 | 2·4 | 2,260·5 | 7·0 |
| 2·2·1 ජල බලය .. | | 1,217·2 | – 24·3 | 2,090·6 | 71·8 |
| 2·2·2 තාප බලය .. | | 897·2 | 96·1 | 169·9 | – 81·1 |
| 2·3 මුළු අලෙවිය .. | කි.වො.පැ. දශ ලක්ෂ | 1,792·3 | 6·2 | 1,853·6* | 3·4 |
| 2·3·1 ගෘහස්ථ .. | | 304·8 | 18·0 | 312·9* | 2·7 |
| 2·3·2 කාර්මික .. | | 752·0 | 1·7 | 788·3* | 4·8 |
| 2·3·3 වාණිජ .. | | 292·0 | 11·2 | 295·1* | 1·1 |
| 2·3·4 පළාත් පාලන ආයතන | | 433·2 | 3·7 | 446·0* | 3·0 |
| 2·3·5 වීථි ආලෝක කිරීම .. | | 10·3 | 4·6 | 11·3* | 9·7 |

මූලයන්: ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව; ලංකා විදුලි බල මණ්ඩලය.

* තාවකාලික

984 වර්ෂය අවසානයේදී ලංකා විදුලි බල මණ්ඩලයේ මුළු ස්ථාපිත ධාරිතාවය මෙග
1 ... මෙ. වො.) 812 ක් වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 37 ක වැඩි වීමකි. 1984
වොට්ස් (මෙ ... කාර්තුවේදී වික්ටෝරියා ජල විදුලිය බල ව්‍යාපෘතියේ එකක් මෙ.වො. 70,
වර්ෂයේ අවසාන ... ක් ආරම්භ කිරීම නිසා, එතෙක් පැවති ජල විදුලිය බල ස්ථාපිත ධාරිතාව
බැගින් වූ අදියර දෙක ... 542 දක්වා වැඩි විය. නොවැම්බර් මාසයේදී ආරම්භ කළ මෙ.වො.
මෙ.වො. 402 සිට මෙ.වො. ... න් ක්‍රියා කරවන තාප බල උත්පාදන යන්ත්‍රාගාරය නිසා, 1983
80 ක ධාරිතාවයකින් යුතු ඩීසල්ව ... බල ධාරිතාවය 1984 දී මෙ. වො. 270 දක්වා වැඩි විය.
දී පැවති මෙ. වො. 190 ක ස්ථාපිත තා

විසින් උත්පාදනය කරන ලද කිලෝ වොට්ස්
1984 වර්ෂයේ දී ලංකා විදුලි බල මණ්ඩලය ... විට සියයට 7 ක වැඩි වීමක් පෙන්නුම්
පැය (කි.වො. පැ.) 226 කෝටිය පසුගිය වසර හා සසඳා ... වීමත් සමග පෙර වසරෙහි තාප
කළේය. 1984 වර්ෂයේදී ජල විදුලිය බල සැපයුමේ ශීඝ්‍ර වැඩි ... පෙන්නුම් කරමින් තාප
විදුලිය බල සැපයුම හා සංසන්දනය කිරීමේදී සියයට 81 ක අඩු වීම ... සම, ලංකා විදුලි බල
බල සැපයුම මුළු විදුලිය බල සැපයුමෙන් සියයට 8 දක්වා පහත වැටුනි. එමෙ ... වියදම, පසුගිය
මණ්ඩලය විසින් විදුලිය බල උත්පාදනය සඳහා ඉන්ධන වෙනුවෙන් දරණ ලද
වර්ෂයේ වූ රුපියල් 229 කෝටි 90 ලක්ෂයේ සිට 1984 වර්ෂයේදී රුපියල් 44 කෝටි 30 ලක්ෂය
දක්වා පහත වැටුණි. මෙම ලාභය, මසකට ඒකක 150 ට වැඩියෙන් පරිභෝජනය කරන
පාරිභෝගිකයන්ගෙන් අය කරන ලද ඉන්ධන ගැලපුම් ගාස්තුව 1984 ජූලි මස 1 වැනි දින සිට
සියයට 185 සිට සියයට 150 දක්වා අඩු කිරීමෙන් පාරිභෝගිකයින් වෙත ලබාදෙන ලදී.
මෑත වර්ෂවල දී වියලි කාලයන්හි පුරුද්දක් ලෙස පැවැති විදුලිය බලය කපා හැරීම අත්හැර
දැමීම නිසා පාරිභෝගිකයන්ට නොකඩවා විදුලිය බලය ලබා ගැනීමට හැකි විය.

කෙටි කාලයකින් යහපත් ප්‍රතිඵල ලබා දෙන මූලික ප්‍රතිපත්ති මගින් බලශක්ති අංශයේ නිෂ්පාදනය හා බෙදා හැරීම යන දෙඅංශයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට උත්සාහ දරන ලදී. විදුලිය බල උත්පාදනය, පැවරීම, හා බෙදහැරීමේ දී සිදුවන අපතේ යාම අඩු කිරීම, තෙල් පිරිපහදු කටයුතු වැඩි දියුණු කිරීම සහ ඛණිජ තෙල් පරිවහනයේදී සහ මෙහෙයවීමේදී සිදුවන අපතේ යාම් අඩු කිරීම මෙම ප්‍රතිපත්තිවලට අයත් විය. උත්පාදනය කරන ලද විදුලිය බල-යෙන් සියයට 19 ක ප්‍රමාණයක්, පැවැරීම් හා බෙද හැරීම් ක්‍රියාවලියෙහිදී අපතේ යන බවට ගණන් බලා ඇත. දැනට ක්‍රියාත්මකව පවතින පුනරුත්ථාපන වැඩ සටහන් මාලාව මගින් මෙම පාඩුව අඩුකර ගැනීමට බලාපොරොත්තු වේ. විදුලිය බලය සහ ඛණිජ තෙල් වෙනුවට වෙනත් බලශක්ති ආදේශකයන් වර්ධනය කිරීමට සහ බලශක්ති අංශය විවිධාංගීකරණය කිරීමට අවධානය කර ඇත. වර්ෂය තුළදී, කාර්යක්ෂම සහ පිරිමැසුම් ලෙස දර පාවිච්චි කිරීම, ඉන්ධන වලට ආදේශකයන් වශයෙන් කෘෂිකාර්මික සහ කෘෂි අප ද්‍රව්‍ය පාවිච්චි කිරීම, හිරු රශ්මියෙන් විදුලිය නිපදවීම සහ සුළං බලයෙන් විදුලිය නිපදවීම් ආදිය ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ අනිකුත් විශේෂිත අංශ ලෙස සැළකිය හැකිය. කාර්යක්ෂම ලෙස බලශක්ති පරිහරණය කිරීම වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් වැදගත් බලශක්ති පාරිභෝගිකයන් ලෙස හඳුනා ගන්නා ලද රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ තෝරාගත් ආයතනවල බලශක්ති අධීක්ෂණයන් කරගෙන යන ලදී.

**ගමනාගමනය**

1984 වර්ෂයේ දී ගමනාගමන අංශයෙහි තරමක වර්ධනයක් දක්නට ලැබුණි. රටේ මුළු මගී ප්‍රවාහන සේවයෙන් සියයට 60 ක්ම සැපයූ රාජ්‍ය ප්‍රවාහන ආයතන තවදුරටත් මෙම අංශයෙහි ප්‍රමුඛස්ථ ලෙස රැඳී සිටිනු දක්නට ලැබේ. කෙසේ වෙතත් මගී පරිවහන අංශයෙහි ලා රාජ්‍ය ආයතන සතු වෙළෙඳපොල කොටස 1983 සිට තියුණු අන්දමින් පහත බැස ඇති බව පෙනේ. ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි (ශ්‍රී. ලං. දු. සේ.) පැවති වර්ධනය වූ ක්‍රියාකාරිත්වය නිසා බඩු ප්‍රවාහන අංශයෙහි ද විශාල පුළුල්වීමක් ඇති විය.

වර්ෂය තුළදී ශ්‍රී ලංකාගමනා ගමන මණ්ඩලය (ශ්‍රී ලං. ග. ම.) සිය සේවාවන්හි ප්‍රමාණාත්මක වර්ධනයකට වඩා ගුණාත්මක වර්ධනයක් කෙරෙහි යොමුවී ඇති ආකාරය ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයන්හි ක්‍රියාකාරිත්වය විමසීමේදී පෙනී යයි. මෙම අරමුණු වෙත එළඹීම නිසා ප්‍රා.ග.ම. හි ධාවන පරිමානය 1982 දී පැවති තත්ත්වයෙහි නොවෙනස්ව පැවතුණි.

**1 . 22 සංඛ්‍යා සටහන**

**ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ 1983 - 1984**

| ශීර්ෂය | ඒකක | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස | 1984 | 1983 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. නව මෝටර් රථ ලියාපදිංචි කිරීම | සංඛ්‍යාව | | | | |
| 1.1 ශ්‍රී.ලං.ග.ම. බස් රථ | | 521 | - 6.1 | 325 | - 37.6 |
| 1.2 පෞද්ගලික බස් රථ | | 3,748 | 48.0 | 3,926 | 4.7 |
| 1.3 පෞද්ගලික මෝටර් රථ | | 5,470 | - 3.5 | 5,115 | - 6.5 |
| 1.4 මෝටර් බයිසිකල් | | 14,431 | 33.0 | 16,873 | 16.9 |
| 1.5 ලොරි සහ අනෙකුත් බඩු ගෙන යන වාහන | | 8,191 | 26.8 | 8,227 | 0.4 |
| 2. ශ්‍රී ලං.ග.ම. ක්‍රියාකාරිත්වය | | | | | |
| 2.1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 457.4 | - 5.1 | 422.7 | - 8.0 |
| 2.2 මගී කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 16,065.0 | - 12.0 | 13,785.9* | - 14.2 |
| 2.3 මුළු ආදයම .. | රු. දශ ලක්ෂ | 2,195.8 | 23.9 | 2,367.2 | 7.3 |
| 2.4 මුළු පිරිවැය .. | රු. දශ ලක්ෂ | 2,589.3 | 7.8 | 2,743.0 | 5.9 |
| 2.5 පාඩුව .. | රු. දශ ලක්ෂ | 393.5 | - 37.4 | 375.8 | - 4.5 |
| 3. ශ්‍රී.ලං.දු.සේ. ක්‍රියාකාරිත්වය | | | | | |
| 3.1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 8.2 | - 19.6 | 8.8* | 7.3 |
| 3.2 මගී කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 2,447.2 | - 21.6 | 2,337.0* | - 4.5 |
| 3.3 භාණ්ඩ ටොන් කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 223.8 | 3.2 | 261.8* | 17.0 |
| 3.4 මුළු ආදයම .. | රු. දශ ලක්ෂ | 434.7 | 1.7 | 500.0* | 15.0 |
| 3.5 මුළු පිරිවැය .. | රු. දශ ලක්ෂ | 887.2 | 18.0 | 1,082.4* | 22.0 |
| 3.6 කාරක පාඩුව .. | රු. දශ ලක්ෂ | 452.5 | 39.5 | 582.4* | 28.7 |

* තාවකාලික.

මූලයන් : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව;
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය;
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

1980 සිට නොකඩවා පස් වැනි වරටත් අන්තර් ජාතික සංවර්ධන සමායතනය වෙතින් වාර්ෂිකව ලැබුණු මූල්‍යමය ආධාර මගින් ප්‍රා.ග.ම. සතු වාහන තොගය මෙම වර්ෂයේදීත් වැඩි වී තිබේ. ශ්‍රී ලං.ග.ම. හි ඩිපෝ සහ වැඩපල ඉදිකිරීම්වලට අදාල යටිතල වැඩකටයුතු සඳහා මෙම ණය මුදලින් කොටසක් යොද ගන්නා ලදී.

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 8 ක අඩුවීමක් වාර්තා කරමින් 1984 වර්ෂයේදී ප්‍රා. ග. ම. නවයේ ධාවන කිලෝමීටර් ප්‍රමාණය කිලෝ මීටර් 42 කෝටි 30 ලක්ෂයක් වූ බව ලැබී ඇති තාවකාලික සංඛ්‍යා ලේඛනවලට අනුව පැහැදිලි වෙයි. මේ අතර ප්‍රධාන වශයෙන්ම ප්‍රා. ග. ම. තුනකම ධාවන කටයුතුවල සිදුවුන විස්ථාපනය නිසා විමසුමට ලක්වන වර්ෂය තුළදී ප්‍රා. ග. ම. හට සිය නියමිත සේවාවන්ගෙන් ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ සියයට 75 ක කොටසක් පමණකි. ආරක්ෂක හේතූන් මත ඇතැම් සේවාවන් අත්හිටුවීමට හෝ කපා දැමීමට

උතුරු සහ නැගෙනහිර පළාත් බද ප්‍රා. ග. ම. වලට සිදුවිය. මේ නිසා අපේක්ෂිත කිලෝ මීටර් ගණනින් උතුරු සහ නැගෙනහිර ප්‍රා. ග. ම.ට සියයට 40 කට ආසන්න ප්‍රමාණයක් ද, උතුරු මැද ප්‍රා. ග. ම. ට සියයට 30 ක පමණ ප්‍රමාණයක් ද අහිමි වී ගියේය.

ලාභදායි නොවූ ඇතැම් සේවා නවතා දමමින් ප්‍රා. ග. ම. විසින් තම සේවාවන් ප්‍රති සංවිධානය කිරීමට පියවර ගනු ලැබිය. 1983 වසරේ 1,606 කෝටි 50 ලක්ෂයක් වූ මගී කිලෝ මීටර් ප්‍රමාණය හා සසඳන කල 1984 දී ප්‍රා.ග.ම.හි මුළු මගී කිලෝ මීටර් ප්‍රමාණය, කිලෝ මීටර් 1,378 කෝටි 60 ලක්ෂයක් විය. පැටවුම් සාධකය පිළිවෙලින් 1983 සිට 1984 දක්වා සියයට 70 සිට සියයට 61 දක්වා අඩුවීම නිසා ධාවන කිලෝ මීටර් ප්‍රමාණයට වඩා මගී කිලෝ මීටර් ප්‍රමාණය තියුණු අන්දමින් පහත වැටුනු බව පෙනේ. කෙසේ වුවද, විමසුමට ලක්වන වර්ෂයේ දී දිනකට කිලෝ මීටර් 227 ක් ද, ඉකුත් වර්ෂයේ දී දිනකට කිලෝ මීටර් 226 ක් ද වශයෙන් ප්‍රා. ග. ම. විසින් වාහන උපයෝගී කරගෙන ඇති බව පෙනේ. මෙහි දක්නට ඇත්තේ සුළු වැඩිවීමක් පමණි.

උතුරු සහ නැගෙනහිර පළාත්බදව සිදුවූ සේවා විස්ථාපනය නිසා සිය ආදායම් තත්ත්වය නගා සිටුවීමට ශ්‍රී. ලං. ග. ම. විසින් ගනු ලැබූ උත්සාහයට විශාල වශයෙන් අවහිරතා ඇති විය. එසේ වෙතත්, ප්‍රා. ග. ම. විසින් 1984 දී උපයන ලද ආදායම වැඩිවී ඇත්තේ සියයට 8 ක් තරම් ප්‍රමාණයකිනි. උතුරු නැගෙනහිර සහ උතුරුමැද පළාත් බද ප්‍රා. ග. ම. හට මෙම වර්ෂයේදී සිය ඇස්තමේන්තුගත ආදායමෙන් රුපියල් අට කෝටි 90 ලක්ෂයක පමණ මූල්‍යමය හිඟයකට මුහුණ පෑමට සිදුවිය. මෙම හිඟය 1984 වර්ෂය සඳහා ප්‍රා. ග. ම. නවයෙහි ඇස්තමේන්තුගත ඒකාබද්ධ ආදායමෙන් සියයට 34 ක් පමණ වෙයි. දිගින් දිගටම භාණ්ඩාගාර සහනාධාර මත යැපුනු ශ්‍රී ලං. ග. ම. 1984 දී ද රුපියල් 38 කෝටි 20 ලක්ෂයක භාණ්ඩාගාර සහනාධාරයක් ලබාගන්නා ලදී. ශිෂ්‍ය වාර ප්‍රවේශ පත්‍ර සහ යුද හමුදා හා පොලිස් නිලධාරීන්ගේ නිදහස් ගමන් බලපත්‍ර යනාදියට වැයවන මුදල පියවා ගැනීමට මෙන්ම, ලාභදායි නොවන මාර්ගවල සේවාවන් සඳහා ගෙවන සහනාධාරයක් වශයෙන් ද මෙම භාණ්ඩාගාර ප්‍රතිදානය ලබාදෙන ලදී.

විමසුමට ලක්වන වර්ෂය තුළදී, ශ්‍රී. ලං. දු. සේ. විසින් සිය භාණ්ඩ ප්‍රවාහන සේවය සැලැකියයුතු ලෙස පුළුල් කරන ලදී. ඇතැම් මාර්ගවල සේවා අත්හිටුවීමත්, ආර්ථික වශයෙන් ලාභදායී නොවූ සේවා නවතා දැමීමත් නිසා, 1983 වර්ෂය සමඟ සසඳන විට ශ්‍රී. ලං. දු. සේ. හි මගී කිලෝ මීටර් ප්‍රමාණයෙහි සියයට 5 ක අඩුවීමක් වාර්තා විය. ලැබී ඇති තාවකාලික දත්තවලට අනුව ශ්‍රී. ලං. දු. සේ. හි ධාවන කිලෝ මීටර් ප්‍රමාණය 88 ලක්ෂයක් විය. 1981 සිට දක්නට ලැබුණු අඩුවීමේ ප්‍රවනතාවයට පටහැනිව සියයට 7 ක පමණ වැඩි වීමක් දක්නට ලැබුනි. ඉකුත් වර්ෂයේදී රුපියල් 45 කෝටි 30 ලක්ෂයක්ව පැවැති ලං. දු. සේ.හි ධාවන පාඩුව 1984 දී රුපියල් 58 කෝටි 20 ලක්ෂයක් තරම් පෙරනොවූ මට්ටමකට පත්විය.

නිතිපතා ධාවනය වන පෞද්ගලික බස් සේවාවේ පරිපාලනමය කටයුතුවලට අදාළව පෞද්ගලික බස් රථ සේවා අමාත්‍යාංශයට මුහුණ පෑමට සිදුවූ ප්‍රධානතම ප්‍රශ්නයක් වූයේ, 1983 අංක 44 දරන පෞද්ගලික බස් ප්‍රවාහන පනත මගින් පනවා ඇති කොන්දේසි සහ නියමයන් වෙත බස් ධාවකයන් විශාල සංඛ්‍යාවක් සිය අනුකූලතාවය නොදැක්වීමයි. 1984 දී දෙපාර්තමේන්තුව විසින් ධාවන මාර්ග 1,187 ක බස් ධාවනය කිරීම සඳහා පුද්ගලික බස් ධාවකයන් 9,200කට බලපත්‍ර 9,860 ක් නිකුත් කරමින් රුපියල් එක්කෝටි 40 ලක්ෂයක ආදායමක් උපයා ගන්නා ලදී. 1984 අවසානය වන විට පෞද්ගලික බස් සේවාව මගින් පුද්ගලයින් 82,000 කට ආසන්න සංඛ්‍යාවකට ඍජු සහ වක්‍ර අන්දමින් රැකියා අවස්ථාවන් සැපයූ බවට ඇස්තමේන්තු කර ඇත.

1984 වර්ෂයේ දී මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවෙහි අළුතෙන් ලියාපදිංචි කර ඇති පුද්ගලික බස් රථ සංඛ්‍යාව 3,926 ක් වෙයි. 1983 දී දක්නට ලැබුණු සියයට 48 ක වැඩිවීම සමග සසඳන විට මෙහි ඇත්තේ සියයට 5 ක පමණ සාමාන්‍ය වැඩි වීමකි. 1977 න් ඇරඹී ප්‍රවනතාවයට අනුව, 1984 දී ද මෝටර් රථ හැර අන් සියළුම කාණ්ඩවලට අයත් රථවාහන අළුතින් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව වැඩිවී තිබේ.

ගමනා ගමන අංශයෙහි අන්තර් සම්බන්ධතාවය, පරිවහන සැළසුම්කරණය සඳහා ආයතනික රාමුව සංවර්ධනය කිරීම සහ පවත්නා සම්පත් මනාව පරිහරණය කිරීමෙන් ලබා ගන්නා උසස් කාර්‍යක්ෂමතාවය යන කරුණු ගමනා ගමන අංශයෙහි ඵලදායිතාවය වර්ධනය කිරීමේ දී වැදගත් ක්ෂේත්‍රයන් ලෙස හඳුන්වා දීමට පුළුවන. මෙතෙක් සපුරාගත නොහැකිවූ මෙම පරමාර්ථ ඉටුකර ගනු වස් විස්තරාත්මක ප්‍රවාහන සැලසුමක් සකස් කිරීමටත්, අනාගත ප්‍රවාහන ප්‍රතිපත්තියේ නිර්දේශයන් සකස් කිරීමටත් 1984 දී රජය විසින් අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පත් කරන ලදී. 1983 අංක 44 දරන පෞද්ගලික බස් සේවා පණත යටතේ, පෞද්ගලික බස් ධාවකයන්ගේ දිස්ත්‍රික්ක සංගම් සහ දිස්ත්‍රික්ක සංගම් සම්මේලනය ජාතික මට්ටමින් පිහිටුවා ගැනීමත් මේ සම්බන්ධයෙන් ගනු ලැබූ තාවකාලික පියවර ලෙස දැක්විය හැකිය. වර්ෂය අග භාගයේ දී බදු ව්‍යුහයෙහි ප්‍රතිශෝධනයක් සිදු කරමින් ඇතැම් කාණ්ඩවල මෝටර් රථ වාහන සඳහා පැවති ආනයන තීරු බදු තවදුරටත් ලිහිල් කරන ලදී.

**නිවාස සහ නාගරික සංවර්ධනය**

1984 වර්ෂයේදී, රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක වූ නිවාස ඉදිකිරීම් සහ නාගරික සංවර්ධන වැඩ කටයුතුවල කැපී පෙනෙන ලක්ෂණය වූයේ නිවාස ලක්ෂයේ වැඩපිළිවෙල අවසන් කිරීම සහ නිවාස දස ලක්ෂයේ වැඩපිළිවෙල ආරම්භ කිරීමයි. මෙහිලා රාජ්‍ය අංශයෙහි නිවාස වැඩපිළිවෙළෙහි අවධානය යොමුව ඇත්තේ, රජයේ අවම මැදිහත්වීම සහ උපරිම සහයෝගය ලබාදීම වෙතය. මෙම අරමුණ යටතේ ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙල වැනි අත්තම් නිවාස ඉදිකිරීම් වැඩ පිළිවෙල කෙරෙහි වැඩි සැළකිල්ලක් යොමු කරන ලදී. මේ අතර මැතිවරණ කොට්ඨාශබද නිවාස යෝජනා ක්‍රමය ප්‍රතිසංවිධානය කරන ලද අතර, රාජ්‍ය සේවක නිල නිවාස සහ ජාතික නිවාස ණය අරමුදල ආදිය ක්‍රියාත්මක නොවීය.

විමසුමට ලක් වන වර්ෂය තුළදී නිවාස ඒකක 20,209 ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, නිවාස ඒකක 32,497 ක් නිම වෙමින් පැවතුණි. ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් හා සසඳන කල මීට අදළ සංඛ්‍යාවන් පිළිවෙලින් 11,658 සහ 8,091 විය. 1984 දී නිම කරන ලද මුළු නිවාස ප්‍රමාණයෙන් 16,092 ක් (ආසන්න වශයෙන් සියයට 50 ක්) ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙල යටතේ නිම කරන ලදී.

රාජ්‍ය අංශයේ නිවාස ඉදිකිරීම් සඳහා වූ මුළු වියදම රුපියල් 49 කෝටි 50 ලක්ෂයක් විය. මෙය 1983 වර්ෂයේ අදළ සංඛ්‍යාව වූ රුපියල් 59 කෝටි 50 ලක්ෂය සමග සැසඳේ. වියදම් අංශයෙහි හටගත් මෙම පහත බැසීම තුළින් වැඩි වශයෙන් අඩු වියදම් නිවාස ඉදිකිරීම කෙරෙහි වූ නැඹුරුවීම හා අත්තම් නිවාස වැඩපිළිවෙල කෙරෙහි වැඩි අවධානයක් යොමු වූ ආකාරය පැහැදිලි කරයි. අධික වියදම් සහිත නිවාස යෝජනාක්‍රම විධිමත් කිරීම නිසා සෘජු ඉදිකිරීම් සඳහා වූ වියදම රුපියල් 39 කෝටි 90 ලක්ෂයේ සිට රුපියල් 23 කෝටි 20 ලක්ෂය දක්වා පහත වැටුණි. එසේ වුවද, වර්ෂය තුළදී ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙල යටතේ නව නිවාස ඒකක 16,092 ක් ඉදිකර ඇති අතර, ඒ සඳහා රජය විසින් දරන ලද වියදම් රුපියල් 18 කෝටි 80 ලක්ෂයක් පමණක් විය.

නාගරික සංවර්ධන අධිකාරිය (නා. සං. අ.) විසින් ඒකාබද්ධ සැළසුම් වැඩිදියුණු කිරීම සහ රටේ නාගරික ප්‍රදේශ ආශ්‍රිත නිවාස යෝජනාක්‍රම නගා සිටුවීමට තවදුරටත් කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, රජයේ ප්‍රාග්ධන වියදම් නැවත බෙදා හැරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ

යෝජනා ක්‍රමයන්හී ඉදිකිරීම් කටයුතු සීමා කිරීමට සිදුවිය. 1984 වර්ෂය සඳහා නා. සං. අ. හි මුළු වියදම වූ රුපියල් 40 කෝටි 30 ලක්ෂයෙන් රුපියල් 21 කෝටියක් රජය විසින් සපයන ලදී. 1984 දී නා.සං.අ. විසින් කාර්යාල, හෝටල්, බැංකු, කර්මාන්ත සහ සාප්පු සංකීර්ණ වැනි ප්‍රධාන සංවර්ධන ව්‍යාපාර සඳහා ඉඩම් ලබාගැනීම සහතික කිරීමේ අභිලාෂයෙන් ඉඩම් බැංකුව පිහිටුවන ලදී. කොළඹ නගරයේ මෙන්ම, අනෙකුත් ප්‍රධාන නගර අවට වාසය කරන අඩු ආදයම් ලබන පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා නා. සං. අ. විසින් මුඩුක්කු හා පැල්පත් නඟා සිටුවීමේ ව්‍යාපාරය තවදුරටත් පවත්වාගෙන යන ලදී.

**1 . 23 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයෙහි නිවාස වැඩපිළිවෙලහි ප්‍රගතිය 1983 - 1984**

| වැඩපිළිවෙළ | සම්පූර්ණ කරන ලද ඒකක ගණන | | | ඉදිකෙරෙමින් පැවති ඒකක ගණන | | වියදම (රුපියල් දශ ලක්ෂ) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1978-1984 | 1983 | 1984 | 1983 | 1984 | 1978-1984 |
| 1. සෘජු ඉදිකිරීම් .. | 1,312 | 715 | 11,701 | 1,523 | 884 | 399·5 | 232·1 | 3,196·8 |
| 2. ග්‍රාමීය නිවාස(අ) .. | 7,386 | 3,202 | 29,847 | 6,254 | 4,282 | 112·8 | 62·5 | 693·1 |
| 3. මැතිවරණ කොට්ඨාශබද නිවාස(ආ) .. | 2,960 | 200 | 10,510 | 290 | 210 | 19·4 | 12·8 | 607·6 |
| 4. රජයේ සේවක නිල නිවාස .. | — | — | — | 24 | — | 7·5 | — | 88·2 |
| 5. ජාතික නිවාස ණය අරමුදල .. | — | — | 28,000 | — | — | — | — | 275·0 |
| 6. ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙල .. | — | 16,092 | 16,092 | — | 27,121 | — | 188·1 | 188·1 |
| මුළු ගණන .. | 11,658 | 20,209 | 96,150 | 8,091 | 32,497 | 539·2 | 495·5 | 5,048·8 |

(අ) අත්තම් නිවාස, ආදර්ශ ගම්මාන සහ ධීවර නිවාස ඇතුළත්ය.
(ආ) නව අත්තම් නිවාස ක්‍රමය යටතේ

මූලයන්: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; පළාත්පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.

වර්ෂය අවසාන වන විට වාණිජ බැංකු විසින් නිවාස ඉදිකිරීම් සඳහා දෙන ලද ණය මුදල් ප්‍රමාණය හා ශේෂව පැවති ණය මුදල් ප්‍රමාණය රුපියල් 233 කෝටි දශ ලක්ෂයක් විය. මෙය 1983 වර්ෂය අවසානයේදී අයවිය යුතුව තිබූ මුදලට වඩා සියයට 17 ක වැඩිවීමකි. නිවාස ඉදිකිරීම් සඳහා වාර්ෂික ණය පොලී ප්‍රමාණය සියයට 14 සිට සියයට 28 දක්වා අනුපාතයක විය. මේ අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (රා. උ. ආ. බැ.) නිවාස මූල්‍යකරණයෙහි ප්‍රධානතම ආයතනයක් ලෙස ඉස්මතු වී පෙනුණි. 1984 දී රා. උ. ආ. බැංකුවේ ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණය රුපියල් 20 කෝටියේ සිට රුපියල් 200 කෝටිය දක්වා ඉහළ නංවන ලදී. සම්පත් සංචලනය සඳහාත්, ණයකර මත රැඳී පැවැත්ම අඩු කිරීම සඳහාත්, ණය තැන්පතු, ඉදිකිරීම් තැන්පතු, ගිවිසුම් තැන්පතු හා ණය ගැනීම්වලට අදළ තැන්පතු යනාදිය භාර ගැනීමට රා. උ. ආ. බැංකුව වෙත බලය ලැබුණි. රා. උ. ආ. බැංකුව විසින් නිවාස ඉදිකිරීම සඳහා සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 34 කෝටි දස ලක්ෂයක් විය. මීට අමතරව, මූල්‍ය හිඟ පියවීමේ යෝජනාක්‍රමය යටතේ දේපල සංවර්ධකයන් හට රුපියල් එක්කෝටි 80 ලක්ෂයක් ලබාදීම සඳහා අනුමැතිය ලැබුණි. රා. උ. ආ. බැංකුවෙහි විනාශයට පත් දේපළ හා කර්මාන්ත පිළිබඳ අධිකාරිය (වි. දේ. ක. අ.) යෝජනාක්‍රමය යටතේ තවත් රුපියල් එක් කෝටි 30 ලක්ෂයක් එහි ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කරන ලදී.

1954 අංක 37 දරන ජාතික නිවාස පණත යටතේ 1983 දෙසැම්බර් මස පිහිටුවන ලද ගොඩනැගිලි සමාජයක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (නි. සං. මූ. සං.) 1984 අගෝස්තු මාසයේ දී සිය ණය දීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙම ආයතනය සිය සාමාජිකයන්ගෙන් ගොඩනගාගත් අරමුදල්වලින් නිවාස, තට්ටු නිවාස සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා එහි සාමාජිකයන් හට ණය ලබාදීමේ අරමුණ ඇතිව පිහිටුවන ලදී. 1984 වර්ෂය අවසානයේදී

නි. සං. මූ. සංස්ථාව මගින් ලබාදුන් මුළු ණය ප්‍රමාණය රුපියල් 12 ලක්ෂයක් විය. වාර්ෂිකව සියයට 11 සිට සියයට 20 දක්වා වූ පොළී අනුපාතයක් මෙම ණය සඳහා අය කරගනු ලැබීය. මෙම ගොඩනැගිලි සමාජයේ අරමුදල්, සංස්ථාපිත කොටස් හිමිකරුවන් (12) හා දායක කොටස් හිමිකරුවන් (2060) යනුවෙන් දෙයාකාරයක කොටස් හිමිකරුවන්ගෙන් ලැබේ. වර්ෂය අවසානයේදී මෙහි මුළු දායක මුදල රුපියල් 90 ලක්ෂයක් විය.

**1.24 සංඛ්‍යා සටහන**

**කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම්(අ) 1983 - 1984**

| ශීර්ෂය | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස | 1984 | 1983 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. නේවාසික ගොඩනැගිලි .. .. | 532 | – 9·7 | 599 | 5·1 |
| 1.1 නිවාස .. .. | 347 | – 4·7 | 362 | 4·3 |
| 1.2 තට්ටු නිවාස .. .. | 185 | – 17·8 | 197 | 6·5 |
| 2. වානිජ ගොඩනැගිලි .. .. | 4 | – 91·1 | — | — |
| 3. කර්මාන්ත ගොඩනැගිලි .. .. | — | – 100·0 | — | — |
| 4. පාසැල් ගොඩනැගිලි .. .. | — | – 100·0 | — | — |
| 5. එකතු කිරීම සහ වෙනස් කිරීම .. .. | 411 | – 23·6 | 179 | – 56·4 |
| 6. වෙනත් ගොඩනැගිලි .. .. | 39 | – 35·0 | 47 | 20·5 |
| මුළු ගණන .. .. .. | 986 | – 20·80 | 785 | – 20·4 |

මූලය: කොළඹ මහ නගර සභාව.

(අ) රජයේ සහ සංස්ථාවල ගොඩනැගිලි සැළසුම් හැර.

1983 ජුලි මස සිදුවූ කලබල වලින් විනාශයට පත් දේපළ හා කර්මාන්ත අළුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිහිටුවනු ලැබූ විදේක අධිකාරිය විසින් විමසුමට ලක් වන කාලය තුළදී රා. උ. ආ. බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ලංකා බැංකුව මගින් රුපියල් එක් කෝටි 74 ලක්ෂයක ණය මුදලක් මුදා හරින ලදී. මෙයින් රුපියල් එක් කෝටි 43 ලක්ෂයක් නිවාස දේපළ ප්‍රතිසංස්කරණය සහ නගා සිටුවීම සඳහා වූ අතර, රුපියල් 31 ලක්ෂයක් කර්මාන්ත සහ වාණිජ දේපල පුනරුත්ථාපනය කිරීම සඳහා විය. මීට අමතරව, පුනරුත්ථාපන කටයුතු සඳහා දීමනා වශයෙන් රුපියල් 84 ලක්ෂයක් මුදා හරින ලදී.

වාණිජ බැංකු සහ දිගුකාලීන ණය සැපයීමේ ආයතන විසින් පෞද්ගලික අංශය වෙත දෙනු ලබන ණය මුදල් හැරුණු විට පෞද්ගලික අංශයේ නිවාස ඉදිකිරීම් කටයුතු සම්බන්ධව ලබාගත හැකි යෝග්‍ය දර්ශකයක් නොමැත. කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැළසුම් ප්‍රමාණය නාගරික අංශයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාණය මැනීමේ දර්ශකයක් හැටියට යොද ගැණිනි. 1984 දී අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැළසුම් 785 න් 559 ක් ම වාසය සඳහා තැනූ ගොඩනැගිලි විය. වෙනස් කිරීම් හා එකතු කිරීම් සඳහා අනුමත කරන ලද සැලසුම්වල අඩුවීම මගින් නිවාස සහ තට්ටු නිවාස වාණිජ සහ කාර්යාලයීය කටයුතු සඳහා යෝග්‍ය අන්දමින් වෙනස් කිරීමේදී කොළඹ මහ නගර සභාව අනුගමනය කළ නීතිරීතින්හි දැඩි ස්වරූපය පිළිබිඹු කරයි.

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල**

කඩිනම් මහවැලි වැඩපිළිවෙල ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. එනම් වික්ටෝරියා, කොත්මලේ, මාදුරුඔය හා රන්දෙනිගල යන ප්‍රධාන ජලාශ යෝජනා ක්‍රම; පහළ වාරිමාර්ග සහ ඉංජිනේරු කටයුතු; ගොවි පවුල් පදිංචි කිරීම හා කෘෂි නිෂ්පාදන කටයුතු ද වේ. 1984 වර්ෂය තුළදී වැඩපිළිවෙලෙහි මෙම කොටස් තුනෙහිම නොකඩවා සැලකියයුතු ප්‍රගතියක්

වාර්තාවිණි. 1984 වර්ෂය අවසාන වනවිට මෙම යෝජනා ක්‍රමය සඳහා දැරූ මුළු වියදම රුපියල් 2,501 කෝටි 10 ලක්ෂයක් වූ අතර ඉන් රුපියල් 659 කෝටි 70 ලක්ෂයක් හෙවත් සියයට 26 ක් 1984 වර්ෂය තුළදී වියදම් විය.

වික්ටෝරියා යෝජනා ක්‍රමය සඳහා වූ මුළු ප්‍රාග්ධන වියදම 1984 වර්ෂය අවසානය වනවිට රුපියල් 652 කෝටි 30 ලක්ෂයක් වූ අතර එයින් රුපියල් 141 කෝටි 60 ලක්ෂයක් හෙවත් සියයට 22 ක් වර්ෂය තුළදී වියදම් විය. වික්ටෝරියා ජලාශයට ජලය පිරවීම සැළසුම් කළ පරිදි 1984 අප්‍රේල් මාසයේදී ඇරඹිණි. වික්ටෝරියා බලාගාරයේ වැඩ දිගටම කෙරෙමින් පැවති අතර එහි පළමු අදියර දෙක වර්ෂය අවසානයේදී ආරම්භ කෙරුණි. මූලික වැඩ අවසන්වීමත් සමගම වික්ටෝරියා යෝජනා ක්‍රමය නිසා රටේ ජල විදුලිය උත්පාදනය කිරීමේ ධාරිතාව මෙගවොට් 210 කින් වැඩි වනු ඇත.

1979 වර්ෂයේදී ආරම්භ වූ කොත්මලේ යෝජනා ක්‍රමයේ වැඩකටයුතු 1984 වර්ෂයේ දී ද දිගටම කරගෙන යන ලදී. මෙම යෝජනා ක්‍රමය, මහවැලි ගඟේ අතු ගංගාවක් වන කොත්මලේ ඔය හරහා බැඳි වේල්ලක් සහ භූගත ජල විදුලි බලාගාරයකට පිවිසෙන උමං ක්‍රමයකින්ද සමන්විත වේ. මෙම බලාගාරය තුළ ආරම්භයේදී එකක් මෙගවොට් 67 බැගින් වූ විදුලි උත්පාදන ඒකක දෙකක් සවි කරනු ලැබේ. කොත්මලේ ජලාශයට ජලය පිරවීමේ කටයුතු 1984 නොවැම්බර් මාසයේදී අවසන් විය. වර්ෂය අවසානයේදී කොත්මලේ යෝජනා ක්‍රමය සඳහා වූ මුළු වියදම රුපියල් 664 කෝටි 90 ලක්ෂයක් වූ අතර ඉන් රුපියල් 190 කෝටි 70 ලක්ෂයක් හෙවත් සියයට 29 ක් වර්ෂය තුළදී වැයවිය.

1 . 25 සංඛ්‍යා සටහන

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල — ගණන් බලන ලද වියදම්**

රුපියල් දශ ලක්ෂ

| යෝජනා ක්‍රමය | 1984 සඳහා වෙන්කල වියදම | | | 1984 නියත වශයෙන්ම කළ වියදම (අ) | 1984 අවසන් වනවිට සමුච්චිත වියදම් (අ) |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | පරිපූරක | එකතුව | | |
| 1· වික්ටෝරියා ජලාශය .. | 1,536 | 258 | 1,794 | 1,416 | 6,523 |
| 2· කොත්මලේ ජලාශය .. | 1,304 | 595 | 1,899 | 1,907 | 6,649 |
| 3· රන්දෙනිගල ජලාශය .. | 938 | 30 | 968 | 848 | 1,893 |
| 4· මාදුරුඔය ජලාශය .. | — | — | — | 25 | 2,532 |
| 5· මිනිපේ ඇල සංකීර්ණය .. | — | 136 | 136 | 245 | 1,165 |
| 6· 'බී' වාරිමාර්ග කලාපය .. | 1,150 | 62 | 1,212 | 1,184 | 2,442 |
| 7· 'සී' වාරිමාර්ග කලාපය .. | 624 | 110 | 734 | 621 | 1,838 |
| 8· 'ජී' වාරිමාර්ග කලාපය .. | 82 | 47 | 129 | 63 | 63 |
| 9· I සහ II අදියර .. | 200 | — | 200 | 252 | 1,595 |
| 10· අනෙකුත් .. | 153 | — | 153 | 36 | 311 |
| එකතුව .. | 5,987 | 1,238 | 7,225 | 6,597 | 25,011 |

(අ) තාවකාලිකයි. මූලය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

මාදුරුඔය ජලාශ යෝජනා ක්‍රමය මූලික වශයෙන් වාරිමාර්ග සහ ගොවි පවුල් පදිංචි කිරීමේ යෝජනා ක්‍රමයක් වේ. ජලාශයේ ප්‍රධාන වැඩ කටයුතු 1983 වර්ෂයේදී අවසන් විය. අතිරේක වශයෙන් මහවැලි ජලයද එක් රැස් කරන මෙම ජලාශය මගින් අළුත් ඉඩම් හෙක්ටයාර 37,500 කට සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 3,700 කටද ජල පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ. 'බී' කලාපයේ ජලය බෙද හරින ඇල මාර්ග ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතිණි. 1984 වර්ෂය අවසාන වනවිට මෙම යෝජනා ක්‍රමය සඳහා මුළු වියදම රුපියල් 253 කෝටි 20 ලක්ෂයක් වූ අතර ඉන් රුපියල් දෙකෝටි 50 ලක්ෂයක් 1984 වර්ෂය තුළදී වියදම් කරනු ලැබීය.

රන්දෙනිගල යෝජනා ක්‍රමය කඩිනම් මහවැලි වැඩපිළිවෙලෙහි විශාලතම ජලාශ යෝජනා ක්‍රමය වේ. මෙම ජලාශය මගින් පළමුව 'සී' සහ 'ඩී' කලාපවලටද පසුව 'ඒ' කලාපයටද ජල පහසුකම් සපයනු ඇත. 1984 වර්ෂය අවසාන වනවිට මෙම යෝජනා ක්‍රමය සඳහා මුළු වියදම රුපියල් 189 කෝටි 30 ලක්ෂයක් වූ අතර මෙයින් රුපියල් 84 කෝටි 80 ලක්ෂයක් හෙවත් සියයට 45 ක්ම වර්ෂය තුළදී වැය විය. (මෙම යෝජනා ක්‍රමය සඳහා ජර්මන් සමූහාණ්ඩු ජන රජය මගින් ආධාර සපයනු ලැබේ.) මහවැලි ජලය 'සී' සහ 'බී' කලාපවලට ගෙන යනු ලබන මිනිපේ ඇල සංකීර්ණයේ වැඩකටයුතු අවසන් වූ අතර එය 1984 අප්‍රේල් මාසයේදී විවෘත කරන ලදී.

තාවකාලික දත්තයන්ට අනුව, මහවැලි සංවර්ධන වැඩපිළිවෙලට අයත්වන ප්‍රදේශය තුළ 1983/84 මහ කන්නයේදී හෙක්ටයාර 38,462 ක් වගා කරනු ලැබීය. එය පසුගිය මහ කන්නයේ වගා කරනු ලැබූ බිම් ප්‍රමාණයට වඩා සියයට 23 ක වැඩිවීමකි. 1984 යල කන්නයේදී වගා කරනු ලැබූ මුළු බිම් ප්‍රමාණය පෙර වර්ෂයේ එම කන්නයේදී වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වඩා වැඩිවිය. මහ සහ යල කන්නයේ වගා කළ මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 55,613 ක් හෙවත් සියයට 84 කම වී වගා කරන ලද අතර හෙක්ටයාර 10,575 ක අනෙකුත් ආහාර භෝග වගා කෙරුණි. වී වගාකළ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 67 ක් ද, වෙනත් භෝග වගාවන් සඳහා ප්‍රයෝජනයට ගැණුනු මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 63 ක් ද ඉඩම් සංවර්ධන සහ ගොවි පවුල් පදිංචි කිරීමේ කටයුතු අවසාන වෙමින් පවත්නා 'එච්' කලාපයෙහි විය. මහවැලි පාලන ප්‍රදේශයේ වී වගාකල මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 18 ක් 'සී' කලාපයේ විය.

1984 වර්ෂය තුළදී 'එච්' කලාපයේ වී නිෂ්පාදනය බුසල් 57 ලක්ෂ 50 දහසක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර පසුගිය වර්ෂයේදී එය බුසල් 50 ලක්ෂයක් විය. මෙය රටේ මුළු වී නිෂ්පාදනයෙන් සියයට 5 ක් පමණ වේ.

**1 . 26 සංඛ්‍යා සටහන**

**මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගාකළ අළුත් ඉඩම් ප්‍රමාණය**

හෙක්ටයාර

| ශීර්ෂය | 1981/82 මහ | 1982 යල | 1982 එකතුව | 1982/83 මහ | 1983 යල | 1983 එකතුව | 1983/84 මහ* | 1984 යල* | 1984 එකතුව* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 'එච්' කලාපය .. | **22,568** | **5,919** | **28,487** | **25,261** | **6,546** | **31,807** | **25,284** | **18,676** | **43,960** |
| (අ) වී .. | 20,680 | 2,673 | 23,353 | 22,400 | 3,917 | 26,317 | 23,135 | 14,213 | 37,348 |
| (ආ) අනෙකුත් භෝග | 1,888 | 3,246 | 5,134 | 2,861 | 2,629 | 5,490 | 2,149 | 4,463 | 6,612 |
| 'බී' කලාපය .. | — | **640** | **640** | **2,682** | **1,400** | **4,082** | **2,495** | **1,732** | **4,227** |
| (අ) වී .. | — | 640 | 640 | 2,200 | 1,400 | 3,600 | 1,771 | 1,715 | 3,486 |
| (ආ) අනෙකුත් භෝග | — | — | — | 482 | — | 482 | 724 | 17 | 741 |
| 'සී' කලාපය .. | — | — | — | — | **1,503** | **1,503** | **7,166** | **5,304** | **12,470** |
| (අ) වී .. | — | — | — | — | 1,503 | 1,503 | 5,353 | 4,726 | 10,079 |
| (ආ) අනෙකුත් භෝග | — | — | — | — | — | — | 1,813 | 578 | 2,391 |
| 'ජී' කලාපය .. | — | **2,221** | **2,221** | **3,202** | **1,810** | **5,012** | **3,517** | **2,014** | **5,531** |
| (අ) වී .. | — | 1,588 | 1,588 | 2,958 | 1,321 | 4,279 | 3,292 | 1,408 | 4,700 |
| (ආ) අනෙකුත් භෝග | — | 633 | 633 | 244 | 489 | 733 | 225 | 606 | 831 |
| එකතුව .. | **22,568** | **8,780** | **31,348** | **31,145** | **11,259** | **42,404** | **38,462** | **27,726** | **66,188** |

* තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

1984 වර්ෂය අවසාන වනවිට 'එච්' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 26,285 ක් වූ අතර 'සී' කලාපයේ එම සංඛ්‍යාව 9,440 ක් විය. 'බී' කලාපයේ වසර අවසාන වනවිට පවුල් 5,282 ක් පදිංචි කරවා තිබිණ. 'ජී' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 663 ක් විය. මේ අනුව 1984 වර්ෂය අවසාන වනවිට මහවැලි පාලන ප්‍රදේශය තුළ පවුල් 41,670 ක් පදිංචි කරවා තිබුණි.

1984 දී මහවැලි ආර්ථික ඒජන්සිය මගින් වාරිමාර්ග ක්‍රියාත්මක කිරීමේ සහ නඩත්තු කටයුතු වලින් කොටසක් පියවා ගැනීම් වශයෙන් මෙයින් ප්‍රයෝජන ලබන ගොවීන්ගෙන් වාරිමාර්ග ගාස්තුවක් අය කිරීම ආරම්භ කරනු ලැබීය. මෙම ගාස්තුව 1984 වර්ෂය සඳහා අක්කරයකට රුපියල් 100 ක් වශයෙන් නියම කරනු ලැබූ අතර එය වාරිමාර්ග ක්‍රියාත්මක කිරීමේ සහ නඩත්තු කිරීමේ වියදමින් සියයට 50 ක් පමණ වේ යැයි ගණන් බලා ඇත. 1984 වර්ෂය සඳහා මෙම ගාස්තුවෙන් ලද ආදයම (උඩවලවේ යෝජනා ක්‍රමය හැර) රුපියල් 42 ලක්ෂයක් වූ අතර එය නියමිත ප්‍රදේශයේ ගොවීන් විසින් ගෙවිය යුතුව තිබුන ඇස්තමේන්තුගත මුදලින් සියයට 68 ක් පමණ විය.

## වාරිමාර්ග සංවර්ධනය

වඩා යහපත් භෝග නිෂ්පාදනයක් සඳහා වාරිමාර්ගවල ඇති වැදගත්කම ඉකුත් දශක දෙක තුළ සැළකියයුතු පරිදි වැඩිවී ඇත. ශ්‍රී ලංකාවේ වර්තමාන වාරිමාර්ග සංවර්ධනයට නව යෝජනා ක්‍රම ඉදිකිරීම ද, දැනට පවත්නා විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම හා පරිපාලනය වැඩි දියුණු කිරීමද කුඩා වැව් හා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සහ පුනරුත්ථාපනය කිරීමද ඇතුළත් වේ. කඩිනම් මහවැලි වැඩපිළිවෙලට අමතරව 1984 වර්ෂය තුළදී කිරිඳි ඔය, ඉහිනිමිටිය සහ නිල්වලා ගඟ යන විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම තුනෙහි ඉදි කිරීම් සහ සංවර්ධන කටයුතු කරගෙන යමින් පැවතිණි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරිඳි ඔය යෝජනා ක්‍රමය 1982 දී ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය මගින් අළුත් ඉඩම් හෙක්ටයාර 4,300 කට සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 4,000 කට පමණ වාරිමාර්ග පහසුකම් සැළසිය හැකි ඝන මීටර 22 කෝටි 70 ලක්ෂයක (අක්කර අඩි 1,83,800 ක) ධාරිතාවක් ඇති ජලාශයක් තැනීම අපේක්ෂා කෙරේ. ප්‍රධාන බැම්මේ සහ ජලය බෙදා හරින ඇළ මාර්ගවල තැනීම් කටයුතුවලින් සැළකිය යුතු ප්‍රමාණයක් වර්ෂය තුළදී නිම කරන ලදී. යෝජනා ක්‍රමයේ මුළු වියදම රුපියල් 160 කෝටියක් ලෙස ගණන් බලා ඇති අතර, එම වියදමින් කොටසක් ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලින්ද ලැබේ. 1985 වර්ෂය අවසානයේදී යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු නිම කිරීමට අදහස් කෙරේ.

පුත්තලම දිස්ත්‍රික්කයේ ඉහිනිමිටිය යෝජනා ක්‍රමය 1981 දී ආරම්භ කරන ලද අතර, එමගින් හෙක්ටයාර 1,800 ක අළුත් ඉඩම්වලට හා හෙක්ටයාර 750 ක පවත්නා ඉඩම්වලටද වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා මී ඔය හරහා ඝන මීටර 6 කෝටි 50 ලක්ෂයක (අක්කර අඩි 53,000) ධාරිතාවක් ඇති ජලාශයක් තැනීමට අදහස් කෙරේ. යෝජනා ක්‍රමයේ මුළු වියදම රුපියල් 36 කෝටියක් වශයෙන් තාවකාලිකව ගණන් බලා ඇති අතර, මෙයින් සියයට 50 ක් ජපන් රජය මගින් සපයනු ඇත. 1984 වර්ෂය අවසාන වන විට යෝජනා ක්‍රමයේ වැඩවලින් වැඩි කොටසක් නිමකර තිබුණි. මෙම යෝජනා ක්‍රමය 1985 දී විවෘත කිරීමට නියමිතව ඇත.[1]

නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ පළමු අදියර 1983 දී ආරම්භ කරන ලදී. මෙම අදියරේ මුළු වියදම රුපියල් 52 කෝටි 50 ලක්ෂයක් වශයෙන් ගණන් බලා ඇති අතර, මෙයින් රුපියල් කෝටි 44 ක් ප්‍රංශ රජය විසින් සපයනු ඇත. නිල්වලා ගඟේ කිරුළ කැලේ ද්‍රෝණියේ දැනට

---

1. මෙම යෝජනා ක්‍රමය 1985 මාර්තු 25 වැනි දින විවෘත කරන ලදී.

නිතර ජල ගැලීම් වලට භාජනය වන හෙක්ටයාර 4,000 ක පමණ කෘෂිකාර්මික ඉඩම්වල පලදාව වැඩි දියුණු කිරීමට හා භෝග වගාව සූක්ෂම කිරීම මගින් කෘෂිකාර්මික පලදාව වැඩි කිරීමට මෙම යෝජනා ක්‍රමය උපකාරිවනු ඇත.

1981 දී ආරම්භ කරන ලද ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය මගින් පළමුව අපේක්ෂා කරන ලද්දේ වියළි කලාපීය ප්‍රදේශවල ජලපාලන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා එම ප්‍රදේශවල කුඩා වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීමය. එසේ වුවද, 1983 දී තෙත් කලාපීය දිස්ත්‍රික්ක දෙකක් වන ගාල්ල සහ මාතර ද මෙම යෝජනා ක්‍රමයට ඇතුලත් කරන ලදී. යෝජනා ක්‍රමයේ මුළු වියදම රුපියල් 78 කෝටි 50 ලක්ෂයක් වශයෙන් ගණන් බලා ඇති අතර, මෙයින් කෝටි 54 ක් ලෝක බැංකුව විසින් සපයනු ලැබේ. 1983 වර්ෂය අවසාන වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 212 ක් පුනරුත්ථාපනය හෝ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අතර, 1984 දී ද සැළකිය යුතු ප්‍රගතියක් ඇතිවිය. 1984 වර්ෂය තුළදී වැව් 158 ක් පුනරුත්ථාපනය කිරීම අරඹන ලදී.

1976 දී එක්සත් රාජධානියේ හා ලෝක බැංකුවේ ආධාර ඇතිව වැව් පහක් නවීකරණය කිරීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමයේ වියදම රුපියල් 29 කෝටි 30 ලක්ෂයක් වශයෙන් ගණන් බලා ඇත. මෙයින් භෝග වගාව සූක්ෂම කිරීම හා නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජලපාලන කටයුතු වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව අනුරාධපුර හා වවුනියා යන දිස්ත්‍රික්කවල වැව් පහක් නවීකරණය කිරීම අපේක්ෂා කෙරේ. 1984 අවසානය වන විට යෝජනා ක්‍රමයේ වැඩ නිමාවට පත් වෙමින් පැවතිණි.

ජලපාලන කටයුතු වැඩි දියුණු කිරීම, භෝග වගාව සූක්ෂම කිරීම සහ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගල්ඔය යෝජනා ක්‍රමයේ වම් ඉවුර පුනරුත්ථාපනය කිරීම පිණිස ගල්ඔය ජලපාලන යෝජනා ක්‍රමය 1980 දී ආරම්භ කරන ලදී. යෝජනා ක්‍රමයේ මුළු වියදම රුපියල් 49 කෝටියක් වශයෙන් ගණන් බලා ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය විසින් මුළු වියදමින් රුපියල් 33 කෝටි 50 ලක්ෂයක් සපයනු ලැබේ. මෙම යෝජනා ක්‍රමයේ වැදගත් ලක්ෂණයක් වන්නේ පුනරුත්ථාපන වැඩ පිළිවෙළට ක්‍රියාකාරී සහභාගිත්වය ලබා ගැනීම සඳහා ගොවි සංවිධාන පිහිටුවීම ය. 1984 වර්ෂය අවසාන වන විට ගොවීන් 10,800 ක් ඇතුළත් වන එබඳු සංවිධාන 240 ක් පිහිටුවනු ලැබූ අතර, හෙක්ටයාර 15,400 ක් පුනරුත්ථාපනය කරනු ලැබ ඇත. මෙම යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු 1985 වර්ෂයේ අවසානය වනවිට නිම කිරීමට පිළියෙළ කර ඇති අතර, එහි වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිමවනවිට හෙක්ටයාර 23,000 ක බිම් ප්‍රදේශයක ගොවීන් 20,000 ක් පමණ සංඛ්‍යාවකට වාසි සැලසෙනු ඇත.

### ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල

1983 වර්ෂය අවසාන වනවිට දිස්ත්‍රික්ක 7 ක ක්‍රියාත්මක වෙමින් පැවති ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල 1984 දී මන්නාරම, වවුනියාව, රත්නපුරය සහ මොණරාගල යන දිස්ත්‍රික්ක හතරෙහිද ක්‍රියාත්මක කරන ලදී.

1984 වර්ෂයේදී වැඩපිළිවෙල නොකඩවා ක්‍රියාත්මක වූ අතර, එහි සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබුණි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල 1979 දී ආරම්භ කළ අතර එය 1983 අවසානයේ දී නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ සමහර කොටස් ක්‍රියාත්මක කිරීම මූලික සැළසුම් වලට වඩා ප්‍රමාදවීම නිසා, 1984 වර්ෂය තුළදීද, නොකඩවාම කරගෙන යන ලදී. 1984 වර්ෂය අවසානය වනවිට ව්‍යාපෘතිය සඳහා වූ සමුච්චිත වියදම රුපියල් 43 කෝටි 80 ලක්ෂයක් (ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ වියදමෙන් සියයට 94 ක්) වූ අතර වර්ෂය තුළ කරන ලද වියදම රුපියල් හත් කෝටි 80 ලක්ෂයක් විය. 1984 වර්ෂයේදී

පොල් ඉඩම් පුනරුත්ථාපනය, යටි වගාව සහ අන්තර් වගාව සම්බන්ධයෙන් සතුටුදායක දියුණුවක් වාර්තා වී ඇත. ව්‍යාපෘතියේ ග්‍රාමීය ජල සැපයුම් යෝජනා ක්‍රමය යටතේ වර්ෂය තුළදී නල ළිං 200 ක ඉදි කිරීම් කටයුතු නිමකරන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලෙහි දෙවන අදියර 1984 දී ආරම්භ කරන ලදී. ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය මෙම අදියර සඳහා ද මූල්‍ය ආධාර දීමට එකඟ විය. දෙවන අදියර අවුරුදු 3 ක ව්‍යාපෘති කාල පරිච්ඡේදයක් සඳහා වන අතර, ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් පන් කෝටි 70 ලක්ෂයක් විය. ව්‍යාපෘතියේ මෙම අදියර මගින් සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් නංවාලීම, වෘත්තීය පුහුණු කිරීම් දියුණු කිරීම, වන වගාව සහ තේ සහ රබර් නැවත වගාව සඳහා ප්‍රමුඛත්වය දී ඇත.

### 1.27 සංඛ්‍යා සටහන
### ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල – දිස්ත්‍රික්ක අනුව වියදම
### 1983 - 1984

රුපියල් දශ ලක්ෂ

| දිස්ත්‍රික්කය (අ) | ගණන් බලන ලද වියදම | | | සමුච්චිත වියදම | | 1983 වර්ෂය තුළදී | 1984 වර්ෂය තුළදී (ආ) |
|---|---|---|---|---|---|---|---|
| | විදේශීය | දේශීය | එකතුව | 1983 වර්ෂය අවසානය දක්වා | 1984 වර්ෂය අවසානය දක්වා* | | |
| 1. කුරුණෑගල (1979) | 300 | 165 | 465 | 359·9 | 437·9 | 66 | 78 |
| 2. මාතර (1979) | | | | | | | |
| I අදියර | 77 | — | 77 | 74·3 | 81·3 | 7 | 7 |
| II අදියර (1984) .. | 57 | — | 57 | | | | |
| 3. හම්බන්තොට (1979) .. | 240 | — | 240 | 147·7 | 194·7 | 38·8 | 47 |
| 4. නුවරඑළිය (1980) .. | 150 | — | 150 | 68·8 | 108·8 | 25·9 | 40 |
| 5. මාතලේ (1981) .. | 220 | 117 | 337 | 127·5 | 156·5 | 36·1 | 29 |
| 6. පුත්තලම (1981) .. | 226 | 171 | 397 | 185·5 | 245·5 | 57 | 60 |
| 7. බදුල්ල (1982) .. | 276 | 130 | 406 | 48·2 | 99·2 | 24 | 51 |
| 8. වවුනියාව (1984) .. | 254 | 126 | 380 | 4·9 | 39·9 | 4·9 | 35 |
| 9. මන්නාරම (1984) .. | 225 | 113 | 338 | 4·9 | 26·9 | 4·9 | 22 |
| 10. රත්නපුරය (1984) .. | 150 | — | 150 | — | 3·0 | — | 3 |
| 11. මොණරාගල (1984) .. | 170 | — | 170 | — | 6·0 | — | 6 |

* ක්‍රියාත්මක කරන ලද වර්ෂය වරහන් තුළින් දක්වේ. මූලය: සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.

(ආ) තාවකාලිකයි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩ පිළිවෙල ද 1983 අවසානයේ දී නිම කිරීමට බලාපොරොත්තු වුවද ක්‍රියාත්මක කිරීම මූලික සැලසුම් වලට වඩා ප්‍රමාද විය. එම නිසා සමහර වැඩ කටයුතු 1984 වර්ෂය තුළදීද නොකඩවා කරගෙන යන ලදී. 1984 අවසානයේදී ව්‍යාපෘතිය සඳහා ගිය සමුච්චිත වියදම රුපියල් 19 කෝටි 50 ලක්ෂයක් (ඇස්තමේන්තු කරන ලද පිරිවැයෙන් සියයට 81 ක්) වූ අතර මෙයින් රුපියල් හාර කෝටි 70 ලක්ෂයක් වර්ෂය තුළදී වැය කරන ලදී.

නුවරඑළිය වැඩපිළිවෙල සඳහා ගණන් බලන ලද වියදම රුපියල් කෝටි 15 ක් විය. 1984 අවසානය වන විට ව්‍යාපෘතිය සඳහා කළ සමුච්චිත වියදම රුපියල් 10 කෝටි 90 ලක්ෂයක් (ඇස්තමේන්තු කරන ලද මුළු වියදමෙන් සියයට 73) විය. 1984 වර්ෂය තුළදී කුඩා තේ වතු, පශු සම්පත් සංවර්ධනය කිරීම සහ අධ්‍යාපන, සෞඛ්‍ය හා ජල සැපයුම් පහසුකම් දියුණු කිරීම ප්‍රමුඛත්වය ලැබූ අංශ විය.

1981 වර්ෂයේ දී ලෝක බැංකු ආධාර යටතේ ආරම්භ කරන ලද මාතලේ දිස්ත්‍රික්ක වැඩ-පිළිවෙල මගින් 1984 දී සුළු අපනයන භෝග සංවර්ධනය, වන වගාව, වාරිමාර්ග සහ ග්‍රාමීය මාර්ග දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනලදී. 1984 වර්ෂය අවසානය වනවිට ව්‍යාපෘතිය සඳහා කළ සමුච්චිත වියදම රුපියල් 15 කෝටි 70 ලක්ෂයක් වූ අතර එය ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැයෙන් සියයට 47 කි.

පුත්තලම් දිස්ත්‍රික්ක වැඩපිළිවෙලද 1981 වර්ෂයේ ආරම්භ කළ අතර, වාරිමාර්ග සහ ජලපාලනය, පොල්වගා සංවර්ධනය සහ නැවත වන වගාව 1984 වර්ෂයේ ක්‍රියාත්මක වැඩ පිළිවෙලෙහි ප්‍රධාන සංයුතීන් විය. පොල් වගා සංවර්ධන වැඩපිළිවෙල යටතේ වර්ෂය තුළ හෙක්ටයාර 390 ක් පුනරුත්ථාපනය කරන ලද අතර, හෙක්ටයාර 530 ක් නැවත වගා කරන ලදී. ජලපාලනය සහ නැවත වන වගා කටයුතු වල සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබිණ. 1984 අවසානය වනවිට ව්‍යාපෘතිය සඳහා වූ සමුච්චිත වියදම රුපියල් 24 කෝටි 60 ලක්ෂයක් වූ අතර, මෙයින් සියයට 24 ක් වර්ෂය තුළදී වැය කරන ලදී.

බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල 1982 වර්ෂයේ මැද භාගයේ දී ආරම්භ කෙරුණු අතර, මෙම ව්‍යාපෘතිය සඳහා ගණන් බලන ලද වියදම රුපියල් 40 කෝටි 60 ලක්ෂයක් විය. මෙම ව්‍යාපෘතිය සඳහා මූලාශ්‍ර දෙකකින් මූල්‍ය පහසුකම් ලැබුණි. ව්‍යාපෘතියේ නිෂ්පාදක අංශයන් සඳහා අරමුදල් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලේ ණය ආධාර මගින් සැපයුණු අතර, සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි සමාජ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා මූල්‍ය ආධාර ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ප්‍රදානයක් මගින් ලැබුණි. 1984 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩපිළිවෙල මගින් කුඩා තේ වතු, ග්‍රාමීය මාර්ග සහ ග්‍රාමීය ජල සැපයුම සංවර්ධනය කිරීම යන කටයුතු අවධාරණය කරන ලදී. 1984 වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතිය සඳහා ගිය සමුච්චිත වියදම රුපියල් නව කෝටි 90 ලක්ෂයක් විය. මෙයින් පන් කෝටි 10 ලක්ෂයක් වර්ෂය තුළදී වැය කරන ලදී.

මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කයන්හි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල 1984 වර්ෂයේ ආරම්භ කළ අතර, මෙහි වැඩි ප්‍රමාණයක් සඳහා මූල්‍ය ආධාර ලෝක බැංකුව මගින් සැපයුණි. මන්නාරම වැඩපිළිවෙල සඳහා ගණන් බලනලද මුළු පිරිවැය රුපියල් 33 කෝටි 80 ලක්ෂයක්ද වවුනියාව සඳහා රුපියල් 38 කෝටියක්ද විය. වාරිමාර්ග සහ ජලපාලනය, කෘෂිකාර්මික යෙදවුම් සැපයීම, කෘෂිකාර්මික ණය, ධීවර සහ පශු සම්පත් සංවර්ධනය, ග්‍රාමීය විදුලි බල සැපයුම සහ සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් දියුණු කිරීම මෙම ව්‍යාපෘතීන්හි ප්‍රධාන සංයුතීන් විය. 1984 වර්ෂයේ වැඩපිළිවෙල මගින් වාරිමාර්ග සංවර්ධනය, ග්‍රාමීය විදුලිබල සැපයුම, ග්‍රාමීය මාර්ග, සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම සහ නැවත වන වගාව සඳහා ප්‍රමුඛත්-වයක් දෙන ලදී. 1984 වර්ෂය තුළදී මන්නාරම වැඩපිළිවෙල සඳහා ගිය වියදම රුපියල් දෙකෝටි 20 ලක්ෂයක් වූ අතර, වවුනියාව වැඩපිළිවෙල සඳහා රුපියල් තුන් කෝටි 50 ලක්ෂයක් වැය විය.

1984 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයද ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල යටතට ඇතුලත් කරන ලදී. මේ සඳහා මූල්‍ය ආධාර වශයෙන් රුපියල් කෝටි 15 ක් ප්‍රදානය කිරීමට නෙදර්ලන්ත රජය එකඟ විය. වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම 1984 මාර්තු මාසයේදී දිස්ත්‍රික්කයේ කෘෂි පරිසර විද්‍යාත්මක කලාප තුනක ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය මූලික වශයෙන්ම දිස්ත්‍රික්කයේ වඩාත් නොදියුණු ප්‍රදේශ වලින් තෝරා ගන්නා ලද ජන කොටස් සඳහා, වඩා යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම අරමුණු කරගෙන ඇත. ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල ජල සැපයුම් පහසුකම් දියුණු කිරීම සඳහා වැදගත් ස්ථානයක් දී ඇත.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල යටතට ඉතාමත් මෑතකදී එක්වූයේ මොණරාගල දිස්ත්‍රික්කයයි. මෙම දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම 1984 වර්ෂයේ මැද භාගයේ දී ආරම්භ කරන ලද අතර, එහි ව්‍යාපෘති කාලය වර්ෂ තුනක් විය. ව්‍යාපෘතිය සඳහා ගණන් බලන ලද මුළු පිරිවැය වූ රුපියල් 17 කෝටියක අරමුදල සංවර්ධනය සඳහා වන නෝර්වීජියානු ආධාර යටතේ ලැබුණි. ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළදී එය වඩා කඩිනම්ව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම පහසුවීම පිණිස දිස්ත්‍රික්ක සැළසුම් වල ආයතනික හැකියාව දියුණු කිරීම සඳහා 1984 වර්ෂයේ විශේෂ අවධානයක් යොමු කරන ලදී.

## සේවා නියුක්තිය

1984 වර්ෂයේදී රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය වර්ධනය වූ අතර, අර්ධ රාජ්‍ය අංශයෙහි එය පහත වැටුණු බව දැනට තිබෙන දත්ත අනුව පෙනී යයි. ඒ අතර නාගරික පෞද්ගලික අංශයෙහි සහ සංවිධානය නොවූ ග්‍රාමීය අංශයෙහි සේවා නියුක්තිය වැඩි වූ බවට සළකුණුද දක්නට ඇත.

මූලික ඇස්තමේන්තු අනුව 1983 දී සේවා නියුක්තියේ සියයට එකකටත් අඩු වර්ධනය හා සැසඳු කල 1984 දී රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය සියයට 1.2 කින් හෝ 5,200 කින් පමණ වර්ධනය වූ බව දක්නට ඇත. සේවා නියුක්තියෙහි සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබෙන්නේ වාරිමාර්ග සහ ජලාපවහන කටයුතු යටතේ ඉදි කිරීම් සහ සංවර්ධනය, ගොවි ජනපදයන්හි ඉඩම් සංවර්ධනය, පශු නිෂ්පාදනය, පළාත් පාලනය, නීතිය ක්‍රියාත්මක කිරීම, ආරක්ෂක සහ රෙගු සේවා යන ක්ෂේත්‍රයන්හිය.

1983 දී සියයට 0.2 ක සුළු වර්ධනය හා සැසඳු කල 1984 දී අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා නියුක්තිය සියයට 2.6 කින් පහත වැටී ඇත. වියදම් අඩු කර ගැනීමේ අදහසින් අනුගමනය කරන ලද ප්‍රතිසංවිධාන ප්‍රතිපත්ති වැවිලි අංශයේ ආයතනද ඇතුළු අර්ධ රාජ්‍ය අංශයේ ආයතන වැඩි කොටසක සේවා නියුක්තිය පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ 1984 සඳහා අවසාන ඇස්තමේන්තු සේවක අර්ථ සාධක අරමුදලේ ක්‍රියාකාරී ගිණුම් පදනම් කරගෙන සපයා ගත හැකි නමුදු එම ඇස්තමේන්තු නැති අතරතුරේදී මෙම අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සාමාන්‍ය උපනතීන් අඳුනා ගැනීමට වෙනත් දර්ශක උපයෝගී කරගත හැකිය. සමස්තයක් වශයෙන් ගත් කල, විමර්ශනයට ලක් වන වර්ෂය තුළදී, සියයට 26 ක වර්ධනයක් සටහන් කර ගනිමින්, පෞද්ගලික කර්මාන්ත අංශය ඉහළ මට්ටමේ දියුණුවක් පවත්වාගෙන ඇත. නිෂ්පාදන වර්ධනය අනු අංශ අනුව ගත් කල රැකියා සැපයෙන ප්‍රමුඛ අංශයක් වන ඇඟලුම් සහ රෙදි නිෂ්පාදන අංශය සියයට 53 කින් වර්ධනය වී ඇත. මහ බැංකුව විසින් පවත්වන ලද කර්මාන්ත සමීක්ෂණය අනුව පෞද්ගලික අංශයේ කර්මාන්තවල සේවා නියුක්තියෙහි පසුගිය වර්ෂයේ ඇති වූ සියයට 8 ක වර්ධනයත් සමග සසඳන කල මෙම වර්ෂයේදී සියයට 10 කින් වැඩි වී ඇත. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් පවත්වන ලද ක්ෂෙත්‍ර සමීක්ෂණයකින් ගත් තොරතුරු අනුව විදේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කරන ලද ව්‍යාපෘති 1984 ජුනි 30 දිනට පුද්ගලයින් 36,625 කට කෙලින්ම රැකියා සපයා ඇත. 1983 ජුනි 30 දිනට මෙමගින් සැපයුනු රැකියා ප්‍රමාණය 26,944 ක් විය. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ පවත්නා යෝජනා ක්‍රම මගින් 1983 අග වනවිට කෙළින්ම සැපයුනු රැකියා සංඛ්‍යාව වන 26,055 ක් හා සසඳන කල 1984 අග වනවිට එමගින් කෙළින්ම රැකියා 29,251 ක් සපයා තිබේ.

1984 තුළදී ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ වඩා හොඳ දියුණුව මෙම අංශයේ රැකියා අවස්ථා වැඩිවී ඇති බව හෝ ඌණ සේවා නියුක්තිය අඩු වූ බව පෙන්නුම් කරයි.